**ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනය - 2021**

**----------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1.** **මතය ව්‍යාවනය**

**--------------------**

ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනයේ ("සම්මේලනය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2** **මතය ව්‍යාවනය සඳහා පදනම**

**------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගෙවිය යුතු දෑ

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
| --- | --- | --- |
| ගෙවිය යුතු ශේෂය රු. 271,167ක් වසර 03 කට වැඩි කාලයක් නිරවුල් කිරීමකින් හෝ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමකින් තොරව හිඟව පැවතුනි. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ගෙවිය යුතු දෑ පියවීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| සාමාජික සහ වාර්ෂික ගාස්තු | 110,000 | රිසිට්පත් පොත | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | සාමාජික සහ වාර්ෂික ගාස්තුවේ නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ලේඛනය ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 රෙගුලාසි සමග අනුකූල නොවීම්

| රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
| --- | --- | --- | --- |
| 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් රෙගුලාසියේ 7 (xi) වගන්තිය | සම්මේලනය විසින් සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම පිළියෙල කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 594,485ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයක් රු. 356,046ක අතිරික්තයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 950,531ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආදායම රු. 297,500කින් අඩුවීම සහ වියදම රු. 653,031කින් වැඩිවීම මෙම පිරීහීමට හේතුවිය.

**3.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

--------------------------------------------

**3.1** **අයවැය පාලනය**

---------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනය 2021 වර්ෂය සඳහා අයවැය සකස් කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ සම්මේලනයේ මූල්‍ය පාලනය ඇගයීමට ලක් කිරීමට නොහැකි විය. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික අයවැය පිළියෙල කළ යුතුයි. |